සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

23 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................

# දේශපාලන විද්‍යාව I

කාලය පැය දෙකයි

- **මෙම ප්‍රශ්න පත්‍රය A - B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුයි.**
- **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

## A කොටස

- **අංක 1 සිට 15 දක්වා වඩාත්ම නිවැරදි හෝ ගැලපෙන පිළිතුර තෝරන්න.**

01. දේශපාලනය යනු,
    1. රාජ්‍ය පරිපාලනය සහ ආණ්ඩුකරණය සම්බන්ධ ක්‍රියාවලියකි.
    2. එය සමාජ ක්‍රියාවලියක් පමණි.
    3. සමාජීය විද්‍යාවන්ට මෑත කාලයේ එක් වූ සංකල්පයකි.
    4. රාජ්‍ය පරිපාලනය, ආණ්ඩුකරණය මෙන්ම සමාජ භාවිතයක්ද වේ.
    5. ශාස්ත්‍රීය ලෙස හැදෑරීමට නොහැකි ක්ෂේත්‍රයකි. (.....)

02. දේශපාලන විද්‍යාව ආරම්භ වූ ග්‍රීක යුගය,
    1. වැඩවසම් සමාජ ක්‍රමය මත පදනම් විය.
    2. එකම ආණ්ඩුක්‍රම රටාවක් මත පදනම් විය.
    3. ක්‍රි.ව. 1-5 ක් අතර කාලයෙහි ක්‍රියාත්මක විය.
    4. සමාජයේ සියලු දෙනාටම පුරවැසිභාවය ලබාදෙන ලදි.
    5. නගර රාජ්‍යයන් මත පදනම් විය. (.....)

03. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස ඉගෙන ගන්නා මාර්ග වනුයේ,
    1. පාසල සහ විශ්වවිද්‍යාලය 2. පවුල 3. දේශපාලන පක්ෂ
    4. ජන සන්නිවේදන මාධ්‍යය 5. ආණ්ඩුව (.....)

04. ''චර්යාවාදයෙන් (විද්‍යාත්මක ප්‍රවේශයෙන්) සිදුවන්නේ සමාජයේ දේශපාලන ව්‍යුහයන් වෙනස් කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ නොව, ඒවා පවත්වාගෙන යාමයි. එය පවත්නා අධිපති බලයට සේවය කරයි'' යන විවේචනය ඉදිරිපත් කළේ,
    1. චර්යාවාදීන්ය 2. ගේබ්‍රියල් ඒ. ආමන්ඩ්ය.
    3. මාක්ස්වාදීන්ය 4. මහත්මා ගාන්ධිය
    5. ස්ත්‍රී වාදීන්ය (.....)

05. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට ඍජු ලෙස අයත් නොවන්නේ,
   1. දේශපාලන දර්ශනය, න්‍යාය, මතවාද
   2. රාජ්‍ය, ආණ්ඩුව හා රාජ්‍ය පරිපාලනය
   3. මිනිසුන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය
   4. තුලනාත්මක දේශපාලනය
   5. සිවිල් සමාජය හා බලපෑම් කණ්ඩායම් (.....)

06. රාජ්‍ය සහ ආණ්ඩුව සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,
   1. බොහෝ දේශපාලන ආයතන උපත ලබන්නේ රාජ්‍ය සහ ආණ්ඩුව වෙතිනි.
   2. ආණ්ඩුව ස්වාමියා වන අතර, රාජ්‍ය සේවකයා වේ.
   3. රාජ්‍යය සහ ආණ්ඩුව ස්ථාවර දේශපාලන ආයතන වේ.
   4. රාජ්‍ය සහ ආණ්ඩුව අනන්‍ය සම වේ.
   5. රාජ්‍ය සහ ආණ්ඩුව එකිනෙකින් වෙනස් වන්නේ 16 වන සියවසේදී පමණය. (.....)

07. දේශපාලන පක්ෂ සහ බලපෑම් කණ්ඩායම්,
   1. දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියයි.
   2. ආණ්ඩුබලය ලබාගැනීමට උත්සාහ දරයි.
   3. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ නැතිවම බැරි අංග වේ.
   4. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමවල පමණක් ක්‍රියාත්මක වේ.
   5. විධිමත් සංවිධාන නොවේ. (.....)

08. සිවිල් සමාජය සම්බන්ධයෙන් නොගැලපෙන ප්‍රකාශය වන්නේ,
   1. රාජ්‍යයෙන් පරිබාහිරව සහ ස්වාධීනව පුරවැසියන් පොදු අරමුණු වෙනුවෙන් එකට සංවිධානය වී සාමූහිකව ක්‍රියාකරන සමාජ අවකාශය සිවිල් සමාජයයි.
   2. සමාජ අවකාශය තුළ ක්‍රියාකරන පුරවැසි සංවිධානය ද සිවිල් සමාජය ලෙස හඳුන්වයි.
   3. දේශපාලන පක්ෂ මෙන් ක්‍රමානුකූල සංවිධාන ව්‍යුහ හා සාමාජිකත්වය ඇති සංවිධාන නොවේ.
   4. සක්‍රීය සිවිල් සමාජයක් පැවතීම, ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක ලක්ෂනයක් නොවේ.
   5. පුළුල් බහුජන කොටස් ඍජු දේශපාලන ක්‍රියාකාරීත්වයට යොමු කිරීම සිවිල් සමාජයේ විශේෂත්වයකි.(.....)

09. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,
   1. ඒකාධිපතිවාදයට එරෙහිව මිනිස් නිදහස තහවුරු කිරීම සඳහා 21 වන සියවසේ පමණ ආරම්භ විය.
   2. බහුතරයේ සහාය පිළිබඳ සංකල්පයකි.
   3. ධනවාදී ආර්ථික ක්‍රමය මත පදනම් වී ඇත.
   4. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය මෙහි මූලික ලක්ෂණයකි.
   5. ව්‍යවස්ථානුකූලවාදය මෙහි අනිවාර්ය ලක්ෂණයකි. (.....)

10. යටත් විජිත රාජ්‍ය,
   1. යුරෝපීය සමාජවල වර්ධනය වූ රාජ්‍ය මාදිලියකි.
   2. ඓතිහාසික වශයෙන් විකාශනය වීම ආරම්භ වූයේ 16 වන සියවසයෙන් පසුවයි.
   3. පිහිටුවන ලද්දේ යුද්ධ ක්‍රියාමාර්ග මගින් පමණි.
   4. විමධ්‍යගත රාජ්‍ය තන්ත්‍රයක් මත සකස් විය.
   5. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ලෙස ගොඩනගන ලදී. (.....)

11. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට අදාල නොවන්නේ,
   1. සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රය මත පමණක් රඳා පවතී.
   2. විෂය අධ්‍යයනයට යොදාගන්නා විෂය පථය වේ.
   3. ගතික ස්වභාවයක් උසුලයි.
   4. දේශපාලන දර්ශනය, මතවාද, න්‍යාය, ආයතන වලට පමණක් සීමා නොවේ.
   5. කලින් කලට විවිධ යුගවල විවිධ විෂය ධාරාවන්ගෙන් සමන්විත වේ. (.....)

12. ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,
   1. රාජ්‍යයේ ස්වාධිපති බලය තනි ජාතික ආයතනයකට පවරා තිබීමයි.
   2. බහු වාර්ගික රටක් සඳහා වඩාත් උචිත වේ.
   3. වඩාත් සංකීර්ණ හා අකාර්යක්ෂම ආණ්ඩුක්‍රමයකි.
   4. මධ්‍යම ආණ්ඩුව විසින් පහල මට්ටමේ ආයතන අහෝසි කිරීමේ අධිකාරිත්වය හිමි කර නොගනී.
   5. ව්‍යවස්ථාදායක ද්වි මාණ්ඩලික වාදය මත පදනම් වේ. (.....)

13. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දී
   1. ජනාධිපති ආණ්ඩුවේ නායකයා වේ.
   2. අගමැතිවරයා ආණ්ඩුවේ නායකයා වේ.
   3. රාජ්‍ය නායකයා ඍජු ලෙසින්ම තෝරා පත්කර ගනී.
   4. විධායකයා ව්‍යවස්ථාදායකයට වගකීමෙන් බැඳී නැත
   5. වඩාත් කාර්යක්ෂම ආණ්ඩුක්‍රමයකි. (.....)

14. විශේෂිත අරමුණු ඉටුකරගැනීමේ අපේක්ෂාවෙන් ස්වාධිපති බලය සහිත රාජ්‍ය විසින් මධ්‍යම ආණ්ඩුවට සීමිත බලයක් ලබාදෙන ආණ්ඩු ක්‍රමයකි.
   1. සන්ධීය ආණ්ඩුක්‍රමය   2. ඒකීය ආණ්ඩුකමය   3. සහසන්ධීය ආණ්ඩුක්‍රමය
   4. කැබිනට් ආණ්ඩුක්‍රමය   5. අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමය (.....)

15. දේශපාලන මතවාදයක් ලෙස මාක්ස්වාදයට අදාල නොවන්නේ,
   1. ධනවාදී ආර්ථික ක්‍රමය කම්කරු පන්ති ශ්‍රම සූරාකෑම මත ගොඩනැගී ඇති බව ප්‍රකාශ කරයි.
   2. ධනවාදී ක්‍රමය පවත්නාතාක් ශ්‍රම සූරාකෑම සහ සමාජ අසමානතා පවතී.
   3. දරිද්‍රතාව, ශ්‍රම සූරාකෑම හා සමාජ අසමානතා අහෝසිකිරීමට නම් සමාජවාදී සමාජ ආර්ථික ක්‍රමයක් පිහිටුවිය යුතු යැයි යෝජනා කරයි.
   4. දේපල සහ ආර්ථික නිෂ්පාදන මාර්ගවල පෞද්ගලික අයිතිය අහෝසි කොට ඒවායේ පොදු සමාජමය අයිතිය ගොඩනන්වයි.
   5. සමාජවාදී සමාජ ආර්ථික ක්‍රමයක් පිහිටුවන්නට නම් ධනේෂ්වර පංතියේ නායකත්වයෙන් සමාජවාදී විප්ලවයක් සිදුවිය යුතුය. (.....)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතරින් නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.**

16. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කියැවෙන ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය වන්නේ,
   A 1860 දශකයේ ජර්මනියේ කම්කරු පන්ති ව්‍යාපාරය පදනම් කොටගෙන ආරම්භක විය
   B පුරෝගාමියා වන්නේ එඩ්වර්ඩ් බර්න්ස්ටයින් ය.
   C අනිවාර්ය කම්කරු පන්ති විප්ලවය පිළිබඳ අදහස ප්‍රතික්ෂේප කළේය.
   D මුලින්ම ආරම්භ වූයේ තුන්වන ලෝකයේ රටවලයි.
   E දෙවන ලෝක යුද්ධයෙන් පසු ජර්මනියේ සහ ස්කැන්ඩිනේවියානු රටවල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරවලට නව පුනර්ජීවයක් ලැබීය.
   1. ABCD   2. BCDE   3. ABCE   4. ABDE   5. ACDE (.....)

17. ෆැසිස්ට් වාදයේ ලක්ෂණ ඇතුළත් වරණය වන්නේ,

A දේශපාලන ඒකබලවාදය

B පෞද්ගලික නිදහස

C රාජ්‍ය වන්දනය

D ජාතිවාදය

E රණවාදය

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5. ACDE (.....)

18 නිරාහමික වාදය හා සම්බන්ධ වරණය වන්නේ,

A 17 වන සියවසේදි පමණ යුරෝපයේ සම්භවය ලැබීය.

B ආගම සහ දේශපාලනය මිශ්‍ර නොවිය යුතු බව කියයි.

C පල්ලිය ගෙනගිය බුද්ධිමය ආධිපත්‍යයට එරෙහිවිය.

D සම්භව්‍ය ලිබරල්වාදයේත්, සමාජවාදයෙත් චින්තනමය මූලාශ්‍රයක් විය.

E ලිබරල් සම්භවයක් ඇතිව ඉන්දියානු නිරාගමිකවාදය ගොඩනැගී ඇත.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5. ACDE (.....)

19. ස්ත්‍රීවාදයා පිළිබඳ කරුණු ඇතුළත් ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

A න්‍යායික සහ ක්‍රියාකාරි සමාජ ධාරාවක් ලෙස යුරෝපයේ සහ ඇමරිකාවේ ආරම්භ විය.

B පීතෘමූලික සමාජ ක්‍රමය ප්‍රතික්ෂේප කරයි.

C ස්ත්‍රී මූලික සමාජ ක්‍රමය අවධාරණය කරයි.

D ප්‍රධාන ධාරා 5 යි.

E චාල්ස් ෆූරිසේ, කේට් මිලට් වැන්නවුන් මේ පිළිබඳ අදහස් ඉදිරිපත් කොට ඇත.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5. ACDE (.....)

20. ලිබරල් දේශපාලන මතවාදය වෙනුවෙන් දායකත්වය සැපයූ දාර්ශනිකයින්, චින්තකයින්, ඇතුළත් වරණය වන්නේ,

A තෝමස් හොබ්ස්

B රූසෝ

C චාල්ස් මොන්ටෙස්ක්‍යු

D ජෝන්ලොක්

E ශාන්ත තෝමස් ඇක්වයිනාස්

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5. ACDE (.....)

- **21 - 25 දක්වා ඇති ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතරින් ප්‍රකාශ 4 ක් නිවැරදි වේ. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.**

21. ගැටුම් වල නිශේධනීය ප්‍රතිඵලයක් වන්නේ,
    1. ලෝක් මට්ටමින් පැතිරී යන ත්‍රස්තවාදි හා ත්‍රස්ත විරෝධී යුද්ධය.
    2. ලෝක මහ බලවතුන් අතර පරමානු අවි සටහනකට ඇතිව තිබූ අවකාශය
    3. සමාජ ඉතිහාසයේ ගාමක බලවේගය වන පංති ගැටුම.
    4. පළමු වන ලෝක යුද්ධය
    5. දෙවන ලෝක යුද්ධය (.....)

22. ගැටුම් ජීවන චක්‍රය හා සම්බන්ධ අවධියක් වන්නේ,
    1. පාදක කොන්දේසි හා අප්‍රකාශිත ගැටුම්
    2. ආර්ථික හා සමාජ සාධක
    3. ගැටුම උත්සන්න වීම
    4. ගැටුම කෙළවර වීම
    5. පශ්චාත් ගැටුම් සාමය ගොඩනැගීම (.....)

23. ප්‍රතිසන්ධානගතවීම යනු,
    1. සංහිඳියාව ඇති කිරීමයි.
    2. අතීතයේ ගැටුමට සම්බන්ද සියලු පාර්ශව මෙන්ම ගැටුම තුළ බෙදී සිටි ජනතාවට ද සාමය ගොඩනැගීම සඳහා එකතු වීමයි.
    3. මිත්‍රත්වය, විශ්වාසය හා අන්‍යෝන්‍ය ගෞරවය පිළිබඳ හැඟීම් මත පදනම් වූ සාධනීය සම්බන්ධතා ගොඩනැගීමයි.
    4. සමනය කළ නොහැකි අරමුණු හා අභිලාශ නිර්මාණය වීමයි.
    5. දේශපාලන සුවකිරීමේ ක්‍රියාවලියයි. (.....)

24. ගැටුම් පිළිබඳ සරල වර්ගීකරණයේ ආකාරයක් වන්නේ,
    1. පුද්ගලාභ්‍යන්තර ගැටුම
    2. අන්තර් පුද්ගල ගැටුම්
    3. කණ්ඩායම් ආකූලතා ගැටුම්
    4. අන්තර් කණ්ඩායම් ගැටුම්
    5. රාජ්‍ය නිර්මාන ගැටුම් (.....)

25. සහමන්ත්‍රණය යනු,
    1. ගැටුමේ ප්‍රචණ්ඩත්වය හා විනශකාරී ප්‍රතිඵල පාලනය කරමින් එහි ව්‍යාප්තියේ පරිමාව සහ තීව්‍රතාව සීමා කිරීමයි.
    2. අපට අන්‍යන්ගෙන් ලබාගැනීමට උවමනා දේ ලබාගැනීම සඳහා යොදාගන්නා මාධ්‍යයකි.
    3. ගැටුමේ යෙදී සිටින පාර්ශව තම ගැටුම විසදා ගැනීම සඳහා යොදාගන්නා සාකච්ඡාමය ක්‍රියාවලියකි.
    4. දෙපාර්ශවය අතර එකඟතාවයක් ඇතිකරගැනීම අරමුණු කරගෙන සිදුවන සන්නිවේදන හුවමාරුවයි.
    5. එකිනෙකට ගැටෙන පාර්ශව අතර පොදු ස්ථාවරත්වයක් නිර්මාණය කරගැනීම සඳහා ඇතිකරන්නා වූ ක්‍රියාවලියයි. (.....)

- **අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට අදාලව ප්‍රකාශ 2ක බැගින් දී ඇත. ඒ ඒ ප්‍රශ්න අංකයට අදාලව දී ඇති යෙදුම් යුගලය සම්බන්ධයෙන් පහත 1 වගුව සඳහා වන යොමුවෙහි සඳහන් 1, 2, 3, 4 හා 5 යන වරණවලින් සුදුසු වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.**

| අංකය | ප්‍රකාශ I | ප්‍රකාශ II |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 26 | රෝම යුගයේ දී දේශපාලන විද්‍යාව දේවධර්ම ශාස්ත්‍රය ඉතිහාසය සහ නීති විද්‍යාව සමඟ සම්බන්ධ විය | 19 වැනි සියවසේදී මානව විද්‍යාව මනෝවිද්‍යාව, භූගෝල විද්‍යාව සමඟ සම්බන්ධ විය. (.....) |
| 27 | පවතින දේශපාලනයේ සැබෑ ස්වරූපය හේතු ඵලවාදය අනුව විග්‍රහකරමින් එහි ඵලවිපාක දැක්වීම දේශපාලන න්‍යායෙන් සිදුවේ. | කිසියම් සංසිද්ධියක් පිළිබඳ ඒ අයුරින් ම මනසින් දකිනු ලබන නව අදහස්වල පිළිඹිබුව දර්ශනයයි. (.....) |
| 28 | සන්ධීය ආණ්ඩුක්‍රමය එකිනෙකට සාපේක්ෂ වශයෙන් ස්වායත්ත ආණ්ඩු මට්ටම් දෙකකින් සමන්විත වේ. | ආණ්ඩු මට්ටම් දෙකෙන් එකකටවත් අනෙක් මට්ටමේ බලතල අත්පත් කරගත නොහැක. (.....) |

| | | |
|---|---|---|
| 29 | සමූහාන්ඩුවාදයට අනුව පුරවැසිභාවය යනු රාජ්‍යයක් / දේශපාලන ප්‍රජාවේ සාමාජිකත්වය හිමිවීමයි. | ලිබරල්වාදයට අනුව පුරවැසිභාවය යනු හුදෙක් රාජ්‍යයේ සාමාජිකත්වය ලබාගැනීම පමණක් නොවන අතර දේශපාලන ක්‍රියාවලියට සක්‍රීය ලෙස සහභාගි වන පොදු යහපත වෙනුවෙන් කැප වී වැඩ කරන පුරවැසියන් සතු යහගුණයකි. (.....) |
| 30 | ජාතිකවාදය නිශ්චිත චින්තකයෙකු හෝ දාර්ශනිකයෙකු හෝ සමඟ අනන්‍ය වී නැත. | ජාතික වාදය යනුවෙන් ක්‍රමානුකූල ඒකාග්‍ර චින්තකයක් ඇත. (.....) |

## B කොටස

31. දේශපාලන විද්‍යාව යනු කුමක්දැයි හඳුනාගැනීමේදී මූලික ලක්ෂණ කිහිපයක් වැදගත් වේ. ඉන් දෙකක් දක්වන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

32. දර්ශනවාදි ප්‍රවේශයේ මූලික ලක්‍ෂන 3 කි. ඉන් දෙකක් දක්වන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

33. දේශපාලන මතවාදයක ලක්‍ෂණ 2 ක් දක්වන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

34. 20 වැනි සියවසේ ප්‍රතිමාණිය න්‍යායන්ට උදාහරණ 2 ක් දක්වන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

35. රාජ්‍ය හා ආණ්ඩුව සංවිධානය වී තිබෙන ව්‍යවස්ථාදායක ආයතන 2 ක් දක්වන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

36. තනි පක්‍ෂ ක්‍රමය ක්‍රියාත්මකවනආණ්ඩුක්‍රමදෙකක් දක්වන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

37. ජාතික රාජ්‍යන්ට ගෝලීයකරණයේ බලපෑම පිළිබඳ න්‍යායික ප්‍රවේශ දෙකක් මතුවිය. ඒ මොනවාද?
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

38. යටත් විජිත රාජ්‍ය ප්‍රතිෂ්ඨාපනය කිරිම නිසා යටත් විජිත සමාජයන්හි දේශපාලන ක්‍රමවල ඇති වූ වෙනස්කම් දෙකක් ලියන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

39. රාජ්‍ය පිළිබඳ මාක්ස්වාදී මතවාදය අනුව රාජ්‍ය විකාශනයේ මුල් අවධිය හා අවසාන අවධිය නම් කරන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

40. ඒකීය රාජ්‍යයන්හි මධ්‍යයේ සිට පහළ මට්ටම්වලට පරිපාලන බලය විසුරුවා හැරීම ප්‍රධාන ආකාර තුනකින් සිදුවේ. ඉන් දෙකක් දක්වන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

41. ඓතිහාසික වශයෙන් සන්ධීය ආණ්ඩුක්‍රම පිහිටුවාගැනීමේ මාර්ග තුනක් පවතී. ඉන් දෙකක් නම් කරන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

42. ජනාධිපති ආණ්ඩුක්‍රම හා පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම අතර කවර ආකාරයේ වෙනස්කම් පැවතිය ද එම ආණ්ඩුක්‍රමයේ ඇති මූලික ගති ලක්ෂණ දෙකක් පවතී. ඒ මොනවාද?
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

43. සමූහාන්ඩුවාදී අදහස්වල වර්ධනය අවධි 4 ක් යටතේ හඳුනාගත හැක. ඉන් දෙකක් ලියන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

44. පැසිස්ට් මතවාදයට අනුව පැසිස්ට් රාජ්‍යයක දැකිය හැකි ලක්ෂණ 02 ක් දක්වන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

45. ගැටුමේ කාර්යන් දෙකකි. ඒවා නම් කරන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

46. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක විධායක කොටස් දෙකකි. ඒවා නම් කරන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

47. සන්ධීය ආණ්ඩු පිහිටුවා ගැනීමට හේතු වූ සාදක දෙකක් ලියන්න.
(i) ..............................................................................................................................
(ii) ..............................................................................................................................

48. සිවිල් සමාජය අර්ථ හතරකින් භාවිතා වේ. ඉන් දෙකක් ලියන්න.

(i) ......................................................................................................................................

(ii) ......................................................................................................................................

49. ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ දෙකක් ලියන්න.

(i) ......................................................................................................................................

(ii) ......................................................................................................................................

50. අර්ධ ජනාධිපති (මිශ්‍ර) ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ 2 ක් ලියන්න.

(i) ......................................................................................................................................

(ii) ......................................................................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| 23 | S | II |

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................

# දේශපාලන විද්‍යාව II

කාලය පැය තුනයි

**සැලකිය යුතුයි :**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ.
- පළමුවැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්ද,
- දෙවැනි කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකක්ද,
- තුන්වැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්ද වන සේ තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

## I කොටස

01. ඔබ දේශපාලන විද්‍යාව හඳුනා ගන්නේ කෙසේ ද? (ල. 20)

02. රාජ්‍ය හා එහි භූමිකාව පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. පහත මාතෘකාවලින් දෙකක් විමසන්න.
    (i) දේශපාලන න්‍යාය (ii) දේශපාලන මතවාද (iii) දේශපාලන පක්ෂ (ලකුණු 20)

## II කොටස

04. පහත මාතෘකා වලින් දෙකක් පිළිබඳ විස්තර කරන්න.
    (i) ඒකීය ආණ්ඩුක්‍රමය (ii) සන්ධීය ආණ්ඩුක්‍රමය (iii) අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමය
    (10 x 2 = 20)

05. ජනාධිපති ආණ්ඩුක්‍රමය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයෙන් වෙන්කර හඳුනාගන්නේ කෙසේද? සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 20)

06. පහත සඳහන් දේශපාලන මතවාද වලින් ඕනෑම දෙකක් විමසන්න.
    (i) නිරාගමික වාදය (ii) සමාජවාදය (iii) ෆැසිස්ට්වාදය (10 x 2 = 20)

07. ගැටුම් යනු කුමක්දැයි නිර්වචනය කොට ගැටුම් වල කාර්යන් විමසන්න. (ලකුණු 20)

## III කොටස

08. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    (i) ගැටුම් ජීවන චක්‍රය (ii) මිශ්‍ර ආණ්ඩු
    (iii) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය (iv) යටත් විජිත රාජ්‍ය (10 x 2 = 20)

09. ''රාජ්‍යය, සමාජයක පවත්නා දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනයකි'' සාකච්ඡා කරන්න. (ලකුණු 20)

10. පහත මාතෘකා වලින් ඕනෑම දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
    (i) රාජ්‍ය හා ස්වාධිපත්‍ය (ii) සිවිල් සමාජය
    (iii) දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය (iv) ලිබරල් වාදය
    (iii) රාජ්‍ය හා පුරවැසියා (10 x 2 = 20)

**දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020 - දේශපාලන විද්‍යාව**

**<u>පිළිතුරු පත්‍රය</u>**

## I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| (01) | - 4 | (11) | - 5 | (21) | - 3 |
| (02) | - 5 | (12) | - 1 | (22) | - 2 |
| (03) | - 1 | (13) | - 2 | (23) | - 4 |
| (04) | - 3 | (14) | - 3 | (24) | - 5 |
| (05) | - 3 | (15) | - 5 | (25) | - 1 |
| (06) | - 1 | (16) | - 3 | (26) | - 2 |
| (07) | - 3 | (17) | - 5 | (27) | - 1 |
| (08) | - 4 | (18) | - 2 | (28) | - 1 |
| (09) | - 1 | (19) | - 4 | (29) | - 4 |
| (10) | - 2 | (20) | - 1 | (30) | - 2 |

31. (i) දේශපාලන විද්‍යාව යනු පැරණිතම ශාස්ත්‍රීය ශික්ෂණයකි.
(ii) වෙනත් ශාස්ත්‍රීය ශික්ෂණයන් සමඟ එකට ගමන් කරන ශික්ෂණයකි.
(iii) විවිධ න්‍යාය, විධික්‍රම ආදියෙන් සමන්විත වේ.

32. (i) ලෝකය පිළිබඳ ඇති මූලික ප්‍රශ්න ඇසීම (ii) දේශපාලන සංකල්පවල ආර්ථික පැහැදිලි කිරීම
(ii) දේශපාලනයේ ප්‍රතිමාණීය අරමුණු ගැන වැඩි උනන්දුවක් දැක්මවී

33. (i) දේශපාලනයට බලපෑම් කිරීම
(ii) සාමාන්‍ය වැසියන්ගේ දේශපාලන තීරණ, විදානය හා චර්යා හැඩගැස්වීම ආදී

34. (i) යුක්තිය පිළිබඳ ජෝන් රෝල්ස්ගේ න්‍යාය (ii) සමූහාන්ඩුවා දීනිදහස පිළිබඳ පිලිප් පෙටික්ගේ න්‍යාය
(ii) මහජන පරිමන්ඩලය පිළිබඳ හබර්මාස්ගේ න්‍යාය

35. (i) පාර්ලිමේන්තුව (ii) සන්ධීය ව්‍යවස්ථාදායක සභා (iii) පළාත් සභා

36. (i) සමාජවාදී ආණ්ඩුකමය (ii) පැසිස්ට් (ඒකාධිපති)

37. (i) ගෝලීයකරණය මගින් ජාතික රාජ්‍ය අවශ්‍යතාවට පත්විය හැකි බව
(ii) ජාතික රාජ්‍ය අවසන් වන්නේ නැතිව විය යුතු ව්‍යුහගත කිරිමට ලක්වන බව

38. (i) පූර්ව යටත් විජිත රාජ්‍ය වලට වඩා විශාල භෞමික රාජ්‍ය බවට පත්වීම
(ii) මිලිටරි රාජ්‍ය ලෙස වර්ධනය වීම (iii) යටත් විජිත රාජ්‍ය මධ්‍යගත රාජ්‍ය තන්ත්‍රයක් ලෙස සකස් වීම.
(iv) යටත් විජිත රාජ්‍ය මිලිටරි, නිලධාරිවාදී රාජ්‍ය ලෙස සකස් වීම.

39. (i) ප්‍රාග් කොමියුනිට්ස් අවධිය (ii) උත්තරීතර කොමියුනනිට්ස් අවධිය

40. (i) බලය විතැන් වීම (ii) පරිපාලනය විමධ්‍යගත කිරීම (iii) බලය පැවරීම

41. (i) කලින් වෙන්ව පැවති ඒකම එකට එකතුව මධ්‍ය අධිකාරියක් නිර්මානය කරගනී.
(ii) බෙදුනු රටක් එකට එකතු වෙමින් සන්ධීය පාලන ක්‍රමයක් ලෙසින් ප්‍රතිව්‍යුහගත කිරීම
(iii) ඒකීය රාජ්‍යයක් වාර්ගික හා සංස්කෘතික විවිධත්වයමත සන්ධීය රාජ්‍යයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම.

42. (i) ව්‍යවස්ථාදායක හා විධායක වෙන වෙනම තේරි පත්වීම (ii) එකිනෙකින් වෙන් වී පැවතීම.

43. (i) සම්භාව්‍ය සමූහාන්ඩුවාදය (ii) යුරෝපයේ පුනරුද සමය
(iii) 18 වැනි සියවසේ ප්‍රංශ සහ ඇමරිකානු සමූහාන්ඩුවාදය (iv) 20 වැනි සියවසේ සමූහාන්ඩුවාදය

44. (i) ඒක බලවාදය (ii) ජාතිවාදය (iii) නායකත්වය වන්දනය රාජ්‍ය උත්තරී කරවීම.

45. (i) සාධනීය කාර්යයන්
(ii) නිශේධනිය කාර්ය
(iii) පුද්ගලයන් හා සමාජ වෙනස්වීමට දායක වීම (iv) සමාජ කණ්ඩායම් වල ඒකාග්‍රතාව ශක්තිමත් වීම

46. (i) නාමික විධායක (ii) සත්‍ය විධායකය

47. (i) භූගෝලිය විශාලත්වය (ii) වාර්ගික හා සංස්කෘතික බහුවිධතාවය

48. (i) සම්භාව්‍ය ලිබරල්වාදී (ii) සම්භාව්‍ය මාක්ස්වාදි
(iii) සංගමික ප්‍රජාතන්ත්‍රවාදී (iv) නව මාක්ස්වාදී ගාම්ෂියානු

49. (i) තනි ජාතික ආණ්ඩුවකට බලය මධ්‍යගත වීම (ii) ස්වාධීපත්‍ය බලය හිමි වෙනත් ආයතන නොතිබිම.

50. (i) ජනාධිපති ඍජු මහජන ඡන්දයෙන් තෝරා ගැනීම
(ii) ජනාධිපතිට සැලකිය යුතු විධායක බලතල හිමිවිම
(iii) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් පිහිටීම හා ව්‍යවස්ථාදායකයට වගකීමෙන් සිටිම.



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
G.C.E. O/L
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440